පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය- ඉතිහාසය

26 සතිය

7 ශ්‍රේණිය

සැකසුම : එම්. ආර්. සී. දිල්රුක්ෂි
ර/මහඹිමාර විද්‍යාලය

## 5 ඒකකය- යුරෝපයේ පැරණි ශිෂ්ටාචාර

### I කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

අංක 1- 5 දක්වා ප්‍රශ්න වලට හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉරි මත ලියන්න.

01. ග්‍රීක ශිෂ්ටාචාරයට අයත් දූපත් අතරින් විශාලම දූපත ..................................... වේ.

02. නගරයට භාවිතා කෙරෙන තවත් නමක් වන්නේ ..................................... යන්නයි.

03. වෛද්‍ය විද්‍යාවේ පියා ලෙස සැලකෙන්නේ ..................................... ය. 04.

..................................... යුද්ධ කටයුතු වලට දක්ෂ රණශූරයෙකි.

05. ලොව පුදුම හතෙන් එකක් වන ..................................... රෝම නගරයේ පිහිටි එළිමහන් ස්ථානයකි.

( ජුලියස් සීසර්, හිපොක්‍රටීස්, කොළෝසියම, ක්‍රීට දිවයින, පුර, ඔගස්ටස් සීසර් )

ප්‍රශ්න අංක 6 - 10 දක්වා දී ඇති ප්‍රකාශය හරි නම් √ ලකුණ ද වැරදි නම් × ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. ග්‍රීසිය කඳු මුදුන් වලින් පිරි රටකි. ( )

07. ග්‍රීසියේ ඇතැන්ස් රාජ්‍යයේ ස්වර්ණමය යුගය ලෙස පෙරික්ලීස් පාලකයාගේ කාලය හඳුන්වා දිය හැකිය. ( )

08. අරාබීන් ශ්‍රී ලංකාව හැඳින්වූයේ තැප්‍රොබේන් යන නමිනි. ( )

09. ග්‍රීක දේව පරපුරේ ප්‍රධානියා වූයේ ඇතීනා දෙවඟනයි. ( )

10. රෝම ශිෂ්ටාචාරයේ පාලන කටයුතු වලට සහය වීමට සෙනෙට් සභාවක් පැවතුණි. ( )

ප්‍රශ්න අංක 11 - 15 දක්වා ᵇ කොටසේ දැක්වෙන ප්‍රකාශ වලට ගැළපෙන පිළිතුරු ඊ කොටසෙන් තෝරා යා කරන්න.

ᵇ ඊ

11. ග්‍රීක ජන සමාජය තිබූ පුද්ගල කොටසකි — 1. රොමියුලස්

12. ග්‍රීක ශිෂ්ටාචාරයේ සිටි සුප්‍රසිද්ධ නාට්‍යකරුවෙකි — 2. ජෙරුසලම

13. ග්‍රීසියේ සිටි විහිෂ්ට ඉතිහාසකරුවෙකි — 3. ප්‍රභූන්

14. මොහු විසින් රෝමය ගොඩනගන ලදැයි ජනප්‍රවාදයක් ඇත. — 4. ඊස්කලස්

15. ජේසුතුමාගේ උත්පත්තිය සිදුව ඇතැයි සැලකෙන ස්ථානය — 5. ඇරිස්ටෝටල්

ප්‍රශ්න අංක 16 - 20 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

16. ග්‍රීක ශිෂ්ටාචාරය වෙළඳ සම්බන්ධතා ඇති කරගත් ආසියාතික රටක් නොවන්නේ,

(i) ඉන්දියාව (ii) චීනය (iii) අප්‍රිකාව (iv) ශ්‍රී ලංකාව

17. ග්‍රීක දාර්ශනිකයෙකු නොවන්නේ,

(i) සොක්‍රටීස් (ii) කාල් රොජර්ස් (iii) ප්ලේටෝ (iv) ඇරිස්ටෝටල්

18. ග්‍රීක ශිෂ්ටාචාරයේ පිහිටීම සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.

(i) මල්ලව පොර (ii) බර ඉසිලීම

(iii) කවපෙත්ත විසි කිරීම (iv) රථ ධාවන තරඟ

19. රෝම ශිෂ්ටාචාරය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.

(i) ඉතාලියේ රෝම නගරය මුල් කරගෙන රෝම ශිෂ්ටාචාරය බිහි විය. (ii) නැගෙනහිරින් ආද්‍රියාතික මුහුදෙන් වට වී ඇත.

(iii) උතුරින් ඇල්ප්ස් කඳුවැටිය නිසා ඉතාලිය රට මැදින් දිගට විහිදී යන කඳු වැටියකි.

20. යුරෝපා ශිෂ්ටාචාරයට රෝමවරුන්ගෙන් ලොවට උරුමවූ දායාදයක් නොවන්නේ,

(i) රෝම නීතිය (ii) ලතින් භාෂාව (iii) කිතුණු දහම (iv) ඔලිම්පික් ක්‍රීඩාව

## II කොටස

පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. ග්‍රීක ශිෂ්ටාචාරය දියුණු වීමට බලපෑ පරිසර තත්ත්වයන් තුනක් ලියන්න.

02. පෞර රාජ්‍යය වල දක්නට ලැබුණු ලක්ෂණ 03ක් ලියන්න.

03. ග්‍රීකවරු වගාකළ දෑ 04ක් ලියන්න.

04. ග්‍රීකවරුන්ගේ වෙළඳ භාණ්ඩ මොනවාද?

05. ග්‍රීකවරුන්ගේ නාට්‍ය වර්ග දෙක නම් කරන්න.

06. හෝමර් කවියාගේ වීර කාව්‍ය දෙක ලියා දක්වන්න.

07. ග්‍රීක ශිෂ්ටාචාරය සම්බන්ධයෙන් පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| ආගම | ක්‍රීඩාව | ලොවට උරුම වූ දායාද |
|---|---|---|
| ...............................<br>................................<br>................................ | ...............................<br>................................<br>................................ | ...............................<br>................................<br>................................ |

08. රෝම පාලකයින් දෙදෙනෙකු පිළිබඳ වාක්‍ය දෙක බැගින් ලියන්න.

09. රෝම සමාජයේ ප්‍රධාන කොටස් තුන ලියා දක්වන්න.

10. රෝමවරු වෙළඳාමේ නියැලුණු රටවල් තුනක් නම් කරන්න.